# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2346/13 – 2023 අගෝස්තු මස 21 වැනි සඳුදා – 2023.08.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2019/349.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2022.11.05 දිනැති හා අංක 2304/87 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2022.10.26 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 02, යූනියන් පෙදෙස, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, අංක 356 හි පිහිටි මාණ්ඩලික නිලධාරීන්ගේ වෘත්තීය සංගමය - සංවර්ධන ලොතරැයි මණ්ඩලය සහ කොළඹ 02, යූනියන් පෙදෙස, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, අංක 356 හි පිහිටි සංවර්ධන ලොතරැයි මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A72/2022 හා 2023.07.31 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 අගෝස්තු මස 09 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 40179 – 11(2023/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණ අංශය සහ කාර්මික අධිකරණයේ දී ය.

යොමු අංකය: IR/COM/01/2019/349.
නඩු අංකය: A/72/2022.

මාණ්ඩලික නිලධාරීන්ගේ වෘත්තීය සංගමය
සංවර්ධන ලොතරැයි මණ්ඩලය,
අංක 356,
ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත,
යූනියන් පෙදෙස,
කොළඹ - 02.

*පළමු පාර්ශ්වය*

එදිරිව

සංවර්ධන ලොතරැයි මණ්ඩලය,
අංක 356,
ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත,
යූනියන් පෙදෙස,
කොළඹ - 02.

*දෙවැනි පාර්ශ්වය*

අතර පවතින කාර්මික ආරාවුල

ප්‍රදානය

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2022.10.26 වන දින බේරුම්කරු වශයෙන් මා පත් කර ඇත.

එකී යොමු කිරීම අනුව ''2022.10.19 වන දින කම්කරු කොමසාරිස් ජනරාල්තුමාගේ යොමුව පරිදි ඉහත සඳහන් පාර්ශ්වකරුවන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වූ කරුණ වූයේ 2002 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා පැවති නිවාඩු දින දීමනා ගෙවීමේ ක්‍රමවේදය වෙනස් කොට 2019 වර්ෂයේදී නව ක්‍රමවේදයක් හඳුන්වා දීම මගින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවය කරන මාණ්ඩලික නිලධාරීන්ට යම් අසාධාරණයක් සිදුව තිබේ ද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේනම් ඔවුන්ට හිමිවිය යුතු සහන කවරේ ද යන්නත් පිළිබඳව වේ.''

මේ පිළිබඳව පැවැත්වෙන බේරුම්කරණය ඉදිරියේ පාර්ශ්වකරුවන්ට තමන්ගේ කතාන්දරය දිවුරුම් ප්‍රකාශයක් මගින් ඉදිරිපත් කරනමෙන් දන්වූයෙමි.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් 2002.02.19 වන දින නිකුත් කරන ලද Internal Memo නම් ලේඛනයේ නිලධාරීන්ට දීමනා (Allowance) වැඩි කිරීම ගැන දක්වා ඇත. පැමිණිලිකරුවන් 2022.11.23 දින ඉදිරිපත් කළ දිවුරුම් ප්‍රකාශය සමග ඉදිරිපත් කළ A 6 ලෙස නම් කළ momo පතේ දක්වා ඇත්තේ,

"As you are aware DLB is open every Saturday, Sunday and on public holiday in order to ensure smooth functioning of the board, Therefore the management committee feels that the following allowance should be increased "

මේ ලිපිය අනුව වැඩි කිරීමට තීරණය කර ඇත්තේ දීමනාවක් (Allowance) බව මම අවධාරණයෙන්ම තේරුම් ගතිමි. එය අතිකාල ගෙවීමක් නොවේ.

ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් ඉදිරිපත් කළ 2022.11.23 දිනැති දිවුරුම් ප්‍රකාශය කෙරෙහි අවධානය යොමු කළෙමි. එම දිවුරුම් ප්‍රකාශයේ දෙවන ඡේදයේ දැක්වෙන A1 ලේඛනයට අවධානය යොමු කළෙමි.

එනම් මාණ්ඩලික නිලධාරීන්ගේ වෘත්තීය සංගමය විසින් කම්කරු කොමසාරිස්තුමා වෙත 2019.02.20 දිනැතිව ඉදිරිපත් කරන ලද A1 වශයෙන් ලකුණු කළ ලිපිය කෙරෙහි අවධානය යොමු කළෙමි.

එම ලිපිය අනුව සංවර්ධන ලොතරැයි මණ්ඩලය සිංහල හා හින්දු අලුත් අවුරුදු දිනවල හා වෙසක් පෝය දින හැර අවුරුද්දේ දින 360 ක් එම ව්‍යාපාර කටයුතුවල නිරත වන බව පෙනේ.

මේ අනුව සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවය අති විශේෂ සේවාවක් බව පෙනේ. එනම් එම තත්ත්වය ව්‍යතිරේකී අවස්ථාවක් (Exceptional) බව පෙනේ. එම ලිපියේ තවදුරටත් සඳහන් වන්නේ,

මණ්ඩලයේ සේවය අන් රජයේ ආයතන මෙන් දින 05 කටත් පැය 8 කටත් සීමා නොවන බවය. තව ද ලොතරැයි දිනුම් ඇදීම සිදු කෙරෙනුයේ රාත්‍රී කාලවලය. එම ආයතනය සෙනසුරාදා ඉරිදා හා වෙනත් නිවාඩු දිනවල ද දෛනික ව්‍යාපාර කටයුතුවල යෙදේ. එම දිනවල මාණ්ඩලික නිලධාරීන් ද සේවය කළ යුතුව ඇත.

එසේම මාණ්ඩලික නිලධාරීන්ගේ දායකත්වය හා මඟ පෙන්වීම මත සෙනසුරාදා දිනවල රුපියල් මිලියන 55 ක පමණ ආදායමක් ද ඉරිදා දිනවල මිලියන 42 ක පමණක් ද පොහොය වැනි නිවාඩු දිනවල රුපියල් මිලියන 28 ක ආදායමක් ද මණ්ඩලයට උපයා දෙන බව ද එකී A 1 ලිපියේ සඳහන් වේ.

මෙම උපයා දෙනු ලබනු ඇතැයි කියන ආදායම හරියටම කීයදැයි කිව නොහැකි වුවත් මෙසේ නිවාඩු දින වැඩ කිරීමෙන් සංවර්ධන ලොතරැයි මණ්ඩලයට අති විශාල මුදල් සම්භාරයක් උපයා දෙන බව නම් ඉතා පැහැදිලිය. මෙම අරමුදල් ප්‍රතිලාභය අවසානයේ ලැබෙන්නේ රජයට බව ද පෙනී යයි.

එසේ දීමනා වැඩි කරන්නේ කුමකට ද යන්න A 6 ලේඛනයේ පලමු ඡේදයේ අන්තර්ගතය එනම්,

"In Order to ensure Smooth functioning of the Board"

එනම් මණ්ඩලයේ මෘදු ප්‍රසන්න පැවැත්ම සඳහා දීමනා වැඩිකර ඇත.

දීමනා වැඩි කරන ක්‍රමය A 6 ලේඛනයේ (2002.02.19 දිනැති මෙමෝවේ) වගුවක දක්වා ඇත.

| Staff Category | Present rate paid on Saturday | Proposed rate | Present rate paid on Public Holidays and Sunday | Proposed Rate |
|---|---|---|---|---|
| Staff Officers<br>M/MMC<br>DGM<br>AGM<br>PA | 1/20 th of basic salary | 1.5/20 th of gross salary | 1/20 of basic salary | 2/20 th of the gross salary |

එබැවින් 2002.02.19 වන දින අභ්‍යන්තර මෙමෝව අනුව මාණ්ඩලික නිලධාරියෙකුට සෙනසුරාදා දිනකට මුළු වැටුපෙන්

$$\frac{1\frac{1}{2}}{20}$$

ක දීමනාවක් ද,

ඉරිදා ඇතුළු රජයේ නිවාඩු දිනවල මුළු වැටුපෙන් 2/20 ක දීමනාවක් ද ගෙවිය යුතුය.

මේ අනුව මෙම සුවිශේෂී කාර්යභාරය සැලකිල්ලට ගෙන මාණ්ඩලික සේවකයන්ට 2002 වසරේ සිට නිවාඩු දින සේවය කිරීම වෙනුවෙන් දිරි ගැන්වීමේ පදනමක් වශයෙන් විශේෂිත ක්‍රම වේදයක් යටතේ පහත සඳහන් ක්‍රම ලෙස වැටුප් ගෙවා ඇත. මේ බව A1 ලිපියේ විස්තර වේ.

මාණ්ඩලික නිලධාරීන් සඳහා

සෙනසුරාදා = මූලික වැටුප X 1.5/160

ඉරිදා හා රජයේ නිවාඩු = මූලික වැටුප X 2.0/160 } උපරිම පැය 8 ක් සඳහා

මෙම දීමනා ගෙවීමේ ක්‍රමය සරලව දක්වන්නේ නම්,

කෙනෙකුට පැයකට ලැබෙන වැටුප මෙන් 1 1/2 ක ප්‍රමාණයක් සෙනසුරාදා දිනවල ද ඉරිදා ඇතුළු සෙසු නිවාඩු දිනවල පැයකට ලැබෙන වැටුප මෙන් දෙගුණයක ප්‍රමාණයක දීමනාවක් ද ගෙවිය යුතු බවය. එය පැය 8 ක උපරිම සීමාවකට යටත් ය.

මෙහි දී ඉතා පැහැදිලිව තේරුම් ගත යුත්තේ මෙම නිලධාරීන්ට ගෙවන්නේ දීමනාවක් මිස අතිකාල ගෙවීමක් නොවන බවය. එබැවින් ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයේ දැක්වෙන රීති සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ නිලධාරීන්ට ගෙවන දිරි ගැන්වීමේ දීමනා සඳහා අදාළ වන්නේ නැත.

මෙම නඩුවට අදාළ අර්බුදය පැන නැගුණේ 2019.04.04 දින විගණන විමසුම අනුවය. එය 2022.11.23 දින ඉල්ලුම්කාර පක්ෂය ඉදිරිපත් කළ A 7 ලියවිල්ලේ සඳහන් වේ. එම A 7 ලෙස අංකිත 2019.04.04 දිනැති ලිපියේ අංක 01 අයිතමයේ සඳහන් වන්නේ,

'' ආයතන සංග්‍රහයේ VIII 4:1 පරිච්ඡේදය අනුව මාණ්ඩලික නිලධාරීන්ට අතිකාල දීමනා ලබා ගැනීමට හිමිකමක් නොමැති නමුත් මාණ්ඩලික නිලධාරීන් සඳහා ද අතිකාල දීමනා දීමට අනුමැතිය දී තිබුණි'' යනුවෙනි.

මෙහි දී එම ලිපිය නිකුත් කළ විගණන අධිකාරී කේ. එච්. යූ. ඩී. සරත් කුමාර මහතා නීතිය හා සිද්ධිය වරදවා වටහාගෙන තිබේ.

මක් නිසාද යත් ඉහත කී A 6 ලෙස අංකිත Internal Memo මගින් යෝජනා කර තිබුණේ දීමනාවක් (Allowance) මිස අතිකාල ගෙවීමක් නොවන නිසාය. කෙසේ වෙතත් A 7 ලිපියේ සඳහන් වන්නේ එය විගණන විමසුමක් පමණක් බවයි. එසේම එම ලිපිය අවසානයේ දක්වා ඇත්තේ අදහස් විමසන බව පමණි.

2022.11.23 දින ඉල්ලුම්කාර පක්ෂය ඉදිරිපත් කළ දිව්රුම් ප්‍රකාශයේ අමුණා ඇති A 8 නම් ලිපිය කෙරෙහි අවධානය යොමු කළෙමි. එනම් මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට අතිරේක ලේකම් එච්. ජී. සුමනසිංහ විසින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සභාපතිතුමා අමතා ලියන ලද්දකි.

එම අතිරේක ලේකම් විසින් මෙම ලිපිය ලියා ඇත්තේ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ක්‍රියාකාරීත්වය ගැන කිසිඳු ප්‍රායෝගික දැනීමක් නොමැතිව විය යුතු ය. එසේම මාණ්ඩලික නිලධාරීන් හට කරන ගෙවීම අතිකාල ගෙවීමක් නොව දීමනාවක් බවත් එබැවින් දීමනා ගැන ආයතන සංග්‍රහයේ VIII 4:1 පරිච්ඡේදයේ කරුණු අදාළ නොවන බවත්, එම ලිපිය ලියූ අතිරේක ලේකම්වරයාට අවබෝධයක් තිබී නැත. පුදුමයට කරුණ නම් ඔහු ලියූ ලිපියේ සඳහන් වන්නේ ද ''ඒකාබද්ධ මාසික වැටුපෙන් 1/20 ක දීමනාවක්'' යනුවෙනි. (අතිකාල ගෙවීමක් නොවේ.)

ඇත්ත වශයෙන්ම A 7 නම් විගණන විමසුමෙන් කර ඇත්තේ අදහස් විමසීමක් පමණි. එහෙත් A 8 ලිපියෙන් අතිරේක ලේකම් මෙම නඩුවට අදාළ අර්බුදය නිර්මාණය කර ඇති බව පෙනේ.

එසේම එකී දිවුරුම් ප්‍රකාශයේ ඇමුණුමක් වන A10 ලෙස අංකිත ලිපිය කෙරෙහි අවධානය යොමු කළෙමි. මෙම ලිපිය සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ගරු සභාපති/ප්‍රධාන විධායක තැන්පත් අනූෂ පැල්පිට මහතා 2021.07.19 වැනි දින තමන්ගේ මණ්ඩලයේ කාර්යභාරය මැනවින් දන්නා බැවින් මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත කරන ලද ඉල්ලීමකි.

ඔහු එම ලිපියෙන් ප්‍රකාශ කර ඇත්තේ වසර 17ක් තිස්සේ නිලධාරීන් භුක්ති විඳි වරප්‍රසාද ඉවත්කිරීම නිසා නිලධාරීන් අධෛර්යමත් වී ඇති අතර, සති අන්ත හා නිවාඩු දිනවල දී කාර්යාලයට පැමිණීම දුර්වල වී ඇති බවයි. තව ද ලොතරැයි මණ්ඩලයේ කාර්යභාරය කිරීම සඳහා සති අන්ත හා රජයේ නිවාඩු දිනවල කාර්යාලය විවෘතව තබා ගැනීම අවශ්‍ය වන බවයි.

ඒ අනුව සති අන්ත දිනවල කාලයට 1.5/20 හා ඉරිදා හා පෝය දිනවල 2/20 වන පරිදි මාණ්ඩලික නිලධාරීන් භුක්ති විඳි වරප්‍රසාදය අනුව ඉදිරියට ගෙවීමට එකඟතාවයද ඉල්ලා ඇත.

ඉන්පසු එකී දිවුරුම් පෙත්සම සමග අමුණා ඇති A9 නම් ලිපිය කෙරෙහි අවධානය යොමු කළෙමි. සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී අනුර ජයරත්න මහතා වැඩබලන සභාපතිගේ අනුමැතිය අනුව ස්වකීය ප්‍රායෝගික දැනුම හා ප්‍රඥාව උපයෝගි කර ගනිමින් මෙම ලිපිය 2020.10.19 වැනි දින ලියා තිබේ. එම ලිපියේ දෙවන ඡේදය අනුව මුදල් අමාත්‍යාංශය වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇති බවත්, එයට පිළිතුරු ලැබෙන තෙක් සෙනසුරාදා හා ඉරිදා දිනවල සේවයට පැමිණීම වෙනුවෙන් වැටුපෙන් 1.5/20 ක් ද නිවාඩු දිනවල පැමිණීම වෙනුවෙන් 2/20 ලෙස ගෙවන මෙන් දන්වා තිබේ.

කෙසේ වෙතත් මේ ආකාරයට නිලධාරීන්ට දීමනා නොගෙවූ බව ද ඉල්ලුම්කාර පාර්ශ්වය බේරුම්කරණයේ දී වාචිකව දන්වන ලදී.

එකී දිවුරුම් ප්‍රකාශය සමග අමුණා ඇති A11 නමැති ලිපිය කෙරෙහි අවධානය යොමු කළෙමි. ඉහත කී A10 ලිපියෙන් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සභාපති කරන ලද විස්තරාත්මක ලිපියෙහි කරුණු කෙරෙහි අවධානය යොමු නොකර මුදල් අමාත්‍යාංශයේ ලේකම් එම්. හේමාල් කස්තුරිආරච්චි මහතා අත්තනෝමතික ලෙස එම A10 ලිපියේ ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇත.

2023.01.23 දිනැතිව සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන) කේ. රෝහණ ප්‍රසාද් රණසිංහ විසින් ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශය කෙරෙහි අවදානය යොමු කලෙමි. එහි සඳහන් ''අභ්‍යන්තර මැමය'' දෝෂ දර්ශනයට ලක්කිරීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලයට කිසිඳු සදාචාරාත්මක අයිතියක් නැත.

මෙම 2002.02.19 දිනැති මැමය අනුව 2019 දක්වා ගෙවීම් කරද්දී නිදා සිටි සංවර්ධන ලොතරැයි මණ්ඩලය ඊට විරුද්ධව කරුණු දක්වීමෙන් ප්‍රතිබන්ධනය වේ. එම දිවුරුම් පෙත්සමේ 06 වැනි වගන්තිය අනුව, සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ මාණ්ඩලික නිලධාරීන්හට සෙනසුරාදා දිනවල 1.5/20 ලෙසත් ඉරිදා හා රජයේ නිවාඩු දිනවල 2/20 ලෙසත් ගෙවීමට අනුමැතිය මණ්ඩලයේ සභාපති විසින් ඉල්ලා ඇත. එම දිවුරුම් පෙත්සම සමග ඉදිරිපත් කළ R5 අංකයැති (2019.10.07 දිනැති ලිපියෙන්) සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සභාපති විසින් මෙම ආයතනයේ නිලධාරීන්හට සෙනසුරාදා දිනවල දී 1.5/20 ලෙසත් රජයේ නිවාඩු දිනවලදී 2/20 ලෙසත් ගෙවීමට මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ඉල්ලා ඇති බව සඳහන් වේ.

දැන් ඊට විරුද්ධවීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලයට නොහැකිය. යම් පාර්ශ්වයක් එකවරම උණුසුම් සුළං හා සීතල සුළං පිට කරන්නේ කෙසේද? (You can't blow hot and cold) - සිංහල කියමනක් දක්වන්නේ නම් දොං නම් දොං, සිමං නම් සිමන් විය යුතුය.

එපමණක් ද නොවේ. 2023.01.23 වැනි දිනැතිව පළමු පාර්ශ්වය වෙනුවෙන් ඉදිරිපත් කළ දිවුරුම් ප්‍රකාශයේ ප්‍රතිඥාකරු වන කරුණාදාසගේ රෝහණ ප්‍රනාන්දු රණසිංහ ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද පෙත්සමට 09 වැනි අත්සන්කරු වශයෙන් අත්සන් කර ඇත. (එකී ඉල්ලුම්කාර පාර්ශ්වය ඉදිරිපත් කළ පෙත්සම ද එකී 2023.01.23 දිනැති දිවුරුම් ප්‍රකාශයේ (ප්‍රතිඥා පත්‍ර) සමග අමුණා ඇති R4 ලේඛනය වේ.)

එබැවින් එකී ප්‍රතිඥාකරු දෙබිඩි ප්‍රතිපත්තියක් අනුගමනය කර ඇත.

කෙසේ වෙතත් මෙම ආරාවුල කම්කරු කොමසාරිස් තුමා වෙත 2019.12.20 වැනි දින ඉදිරිපත් කර ඇත. ගරු නියෝජ්‍ය කම්කරු කොමසාරිස් ආර්. පී. ඉරේෂා උදයංගනී මැතිණිය කරුණු සියල්ල සලකා බලා 2020.02.26 දිනැති ලිපියෙන් පහත සඳහන් පරිදි නිර්දේශ කර ඇත. (නඩු ගොනුවේ 21 වැනි පිටුව)

සති අන්ත හා රජයේ නිවාඩු දිනවල රාජකාරි ඉටුකිරීම වෙනුවෙන් මාණ්ඩලික නිලධාරීන්ට අදාළ දීමනාව ගෙවීමේදී දීර්ඝ කාලයක් අනුගමනය කළ ක්‍රම වේදය බැහැරවීම තුළ අදාළ සේවකයින්ට අගතියක් සිදුවන බැව් නිරීක්ෂණය වේ. එබැවින් මෙතෙක් අදාළ ගණනය කිරීම සඳහා යොදාගත් පදනම උපයෝගී කර ගනිමින් අදාළ දීමනාව ගණනය කිරීම සුදුසු බව නිර්දේශ කරමි.

නියෝජ්‍ය කම්කරු කොමසාරිස්තුමියගේ නිර්දේශය බේරුම්කාර ප්‍රදානය වශයෙන් මම අනුමත කරමි. තව ද සාධාරණ හා යුක්ති සහගත තීන්දුවක් දීම බේරුම්කරුවෙකුගේ යුතුකම බැවින් මේ ගැන මම තවදුරටත් සොයා බැලුවෙමි.

සෙනසුරාදා දිනවල ද වැඩකරන පැයකට ඒකාබද්ධ වැටුපෙන් 1.5/20 ක් ගෙවීම හා ඉරිදා හා රජයේ නිවාඩු දිනවල ඒකාබද්ධ වැටුපෙන් 2/20ක් ගෙවීම දැනට දුම්රිය දෙපාර්තමේන්තුවේ හා තැපැල් දෙපාර්තමේන්තුවේ ද අනුගමනය කරන ක්‍රියා පිළිවෙත බව දැන ගැනීමට ලැබුණි.

ඉහත කී කරුණු අනුව පහත සඳහන් පරිදි මගේ බේරුම්කරණ ප්‍රදානය දෙමි:

2002 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා පැවති ගෙවීමේ ක්‍රමවේදය වෙනස් කොට 2019 වර්ෂයේ දී නව ක්‍රමවේදයක් හඳුන්වා දීම මගින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවය කරන මාණ්ඩලික නිලධාරීන්ට අසාධාරණයක් වී ඇති බවට තීන්දු කරමි.

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ නිලධාරීන් හට මේ 2023.11.23 දිනැති ඉල්ලුම්කාර පාර්ශ්වයේ දිවුරුම් පෙත්සම සමග අමුණා ඇති A6 ලෙස අංකිත 2002.02.19 දිනැති Internal Memo අනුව ගෙවීම් කරන මෙන් නියෝග කරමි. තව ද මේ ආකාරයට නිලධාරීන්ට (දැනට විශ්‍රාම ගොස් හා මියගිය අය ද ඇතුළුව) ගෙවිය යුතු බව ද නියෝග කරමි.

මෙම එක් එක් නිලධාරීන්ට ගෙවිය යුතු මුදල් ප්‍රමාණ පිළිබඳව පාර්ශ්වයන්ගෙන් විමසන ලදුව දෙපාර්ශ්වය ඒ පිළිබඳව වගු දෙකක් ඉදිරිපත් කරන ලදී. ඒ අවස්ථාවේ වගඋත්තරකරු ඉදිරිපත් කළ වගුව දෙපාර්ශ්වයම පිළිගන්නා ලදී. එබැවින් වගඋත්තරකරු ඉදිරිපත් කළ වගුව අනුව පහත සඳහන් පරිදි සියලු දෙනාට ගෙවිය යුතුය.

එසේ ගෙවිය යුතු මුදල් මෙම නියෝගය ගැසට් කළ දින සිට මාස 02ක් ඇතුළත එම නිලධාරීන්ගේ මාසික වැටුප සමග එක් එක් සේවකයාට අදාළ ගණනයන් ඇතුළත්ව රු. 4,981,299.96 (හතළිස් නව ලක්ෂ අසූ එක් දහස් දෙසිය අනූනවයයි සත අනූ හය) ගෙවන මෙන් සංවර්ධන ලොතරැයි මණ්ඩලයට නියෝග කරමි.

එක් එක් නිලධාරියාට ගෙවිය යුතු මුදල් මෙසේය.

| | අංකය | නම | හිඟ මුදල |
|---|---|---|---|
| 1 | 0040 | ඩබ්. කේ. ඒ. ඒ. ජයරත්න මහතා | 177,943.30 |
| 2 | 0082 | ඩී. ඩී. සී. ධම්න්ද මහතා | 103,700.21 |
| 3 | 0117 | කේ. එන්. බුලත්සිංහල මහතා<br>(මියගොස් ඇත - ඔහුගේ උරුමකරුවෙකුට) | 158,111.95 |
| 4 | 0118 | ඩබ්. ඒ. වී. සී. සෝමරත්න මිය | 335,285.68 |
| 5 | 0119 | කේ. එස්. ඒ. ජයරත්න මහතා<br>(විශ්‍රාම ගොස් ඇත) | 195,100.76 |
| 6 | 0224 | ජේ. ඒ. ටී. කේ.ජයසූරිය මහතා | 66,088.12 |
| 7 | 0368 | එම්. එන්. පී. පෙරේරා මහතා | 61,883.73 |
| 8 | 0387 | එස්. එම්. ඒ. ඩබ්. උදයකුමාර මහතා | 96,401.14 |
| 9 | 0388 | ඒ. එස්. ගුණසිංහ මිය | 59,912.65 |
| 10 | 0466 | පී. බී. එම්. හර්ෂණ මහතා<br>(ඉල්ලා අස්වී ඇත) | 116,267.28 |
| 11 | 0511 | කේ. ආර්. ආර්. පී. රණසිංහ මහතා | 381,621.81 |
| 12 | 0540 | පී. ඩී. යූ. මලින්ත මහතා | 131,380.50 |
| 13 | 0007 | ට්. ඩී. අයි. එන්. එස්. අබේරත්න මහතා | 338,443.38 |
| 14 | 0043 | සී. එන්. තෙවරප්පෙරුම මිය | 333,059.08 |
| 15 | 0053 | එන්. වී. ඉන්දික උපුල් මහතා | 228,040.88 |
| 16 | 0061 | ජී. ඩී. එස්. ප්‍රේමතිලක මිය | 65,870.13 |
| 17 | 0064 | බී. ඒ. සී. ජේ. කරුණාරත්න මහතා | 41,486.60 |
| 18 | 0077 | ආර්. ඩී. සී. රාජපක්ෂ මිය | 245,565.77 |
| 19 | 0105 | අයි. ඩී. පී. කුමාරසිරි මහතා | 219,831.81 |
| 20 | 0211 | සී. සී. අයිලප්පෙරුම මහතා | 234,418.73 |
| 21 | 0212 | එම්. බී. එම්. එන්. කේ. බලගල්ල මහතා | 217,185.64 |
| 22 | 0215 | ජී. ඒ. ආර්. එස්. රණතුංග මහතා | 89,793.12 |
| 23. | 0235 | ඩී. එම්. බී. එල්. මහින්ද මහතා | 132,111.18 |
| 24 | 0236 | එම්. කේ. ඒ. අයි. කමලසිරි මහතා | 144,855.58 |
| 25 | 0293 | එම්. එල්. ජී. කෞෂල්‍යා මිය | 82,686.79 |
| 26 | 0294 | එම්. ඒ. එල්. එන්. ගුණසේකර මිය | 797.07 |
| 27 | 0313 | ආර්. ඒ. ඩබ්. ජී. රූපසිංහ මිය | 107,846.55 |
| 28 | 0321 | ජේ. එම්. ඩී. ඒ. ක්‍රිෂාන්ත මහතා | 22,451.92 |
| 29 | 0325 | අයි. ඒ. යූ. ජී. අයිලප්පෙරුම මහතා | 32,459.02 |
| 30 | 0335 | ආර්. ඒ. එස්. රත්නායක මහතා | 118,345.38 |
| 31 | 0337 | ආර්. එම්. යූ. එස්. කුමාර මහතා | 248,247.66 |
| 32 | 0359 | සී. ජේ. බී. ජයවර්ධන මහතා | 28,755.00 |
| 33 | 0528 | පී. පී. ජී. ප්‍රනාන්දු මහතා | 165,351.55 |
| | | **මුළු එකතුව** | **රු. 4,981,299.96** |

මෙම ප්‍රදානය *ගැසට්* ගත කිරීමෙන් දෙමසක් ඇතුළත සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් එම ගෙවීම සිදුකර දකුණු කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත දැනුම් දිය යුතුය. විකල්පයක් වශයෙන් එම මුදල් දකුණු කොළඹ කම්කරු කොමසාරිස් තුමා වෙත තැන්පත් කර අදාළ නිලධාරීන්ට ගෙවිය හැකි බව ද නියෝග කරමි.

මෙම බේරුම්කරණයේ දී ඉදිරිපත් කරන ලද මේ සමග අමුණා ඇති A1, A6, A7, A8, A10, A11, A2 ලේඛන ද මෙම ප්‍රදානයේම අංග බව ද ප්‍රකාශ කරමි.

විජිතානන්ද මඩවලගම,
බේරුම්කරු.

2023 ජූලි මස 31 වැනි දින.

EOG 08 - 0228